---

මහනුවර මහා නගර සභාව

මහනුවර දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 11 දින නගරාධිපතිවරයා වෙත යවන ලදි.

1.2 <u>මතය</u>.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහනුවර මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1994 සිට 2009 දක්වා වර්ෂවල පෙර ගෙවීම් යටතේ දරා තිබූ රු.1,935,684 ක වියදම් එක් එක් වර්ෂවල වියදම් ගිණුම්වලට ගැළපුම් කිරීමකින් තොරව දිගින් දිගටම ජංගම වත්කම් වශයෙන් දක්වා තිබුණි.

(ආ) නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ සැපයීම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් 2012 වර්ෂය සඳහා ලැබී තිබූ රු.260,000 ක ද්‍රව්‍ය ආධාර තොග ගිණුම සහ ආදායම් ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳුණු පාලන ගිණුම්.</u>

ගිණුම් විෂයයන් 03 කට අදාළ ගිණුම් අනුව, ශේෂය රු.202,460,489 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.139,649,111 ක් විය.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,246,769,453 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.192,632,737 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.95,264,377 ක් විය.

### 2.2 බැංකු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2009 සිට 2011 දක්වා වර්ෂවලට අදාළ රු.95,867 ක් වටිනා අගරු චෙක්පත් 08 ක වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු නොකර, සමාලෝචිත වර්ෂය දක්වා ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ආ) ලංකා බැංකුවේ අංක 032764 දරන ජංගම ගිණුම සඳහා 2012 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා සෘජුවම ලැබී තිබූ රු.101,645 ක් සහ අංක 158-1-001-0-1295900 දරන මහජන බැංකුවේ ජල ගිණුමට ලැබී තිබූ රු.2,494,098 ක් හඳුනා ගෙන ගිණුම්වල ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිකුත් කර, මාස 06 ඉක්මවා ඇතත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ, රු.102,500 ක් වටිනා චෙක්පත් 04 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඩී) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2010 ජූනි 01 සිට 2012 නොවැම්බර් 30 දින දක්වා අවස්ථා 06 කදී තැන්පත් කළ එහෙත්, උපලබ්ධි නොවූ රු.58,690 ක් වටිනා චෙක්පත් සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 560,550 | 537,026 | 93,751 |
| (ii) | බදු කුලී | 54,895 | 62,007 | 91,888 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 28,636 | 48,488 | -- |
| (iv) | වෙනත් ආදායම් | 246,450 | 140,292 | 281,471 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 5,740,100 |
| (ii) මුද්දර ගාස්තු | 42,639,511 |

2.3.3 රථගාල් ආදායම්.

2012 නොවැම්බර් 16 දිනැති අංක 1785 දරන ගැසට් නිවේදනයේ විධිවිධාන වලට පටහැනිව ආදායම් බලපත්‍ර ලබා නොගෙන, පුද්ගලික රථගාලක් පවත්වා තිබූ අතර, ආසන්න වශයෙන් අවුරුදු 03 ක කාලයක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබීම නිසා, සභාවට රු.16,500 ක් සහ රජයට රු.3,480 ක් වශයෙන් රු.20,340 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.4 මධ්‍යම වෙළඳ පොළ ආදායම්.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2004 ජනවාරි 01 දින සිට මධ්‍යම වෙළඳ පොළේ දෛනික වෙළඳාම සඳහා තාවකාලික ස්ථාන 304 ක් මාසිකව රු.500 ක බදු මුදලකට පුද්ගලයින්ට ලබා දී තිබූ අතර, එම ගාස්තු සමාලෝචිත වර්ෂය දක්වාම සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම නිසා, සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) මධ්‍යම වෙළඳ පොළේ "කඩඉඩ" වශයෙන් හැඳින්වෙන ස්ථාන 13 ක් සඳහා 2004 වර්ෂයේ සිටම ආදායම් අය කර නොගැනීම හේතුවෙන්, රු.372,624 ක පමණ ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) තාවකාලික බලපත්‍ර ලබා දී තිබූ කඩහිමියන් 237 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,178,255 ක ගාස්තු හිඟව පැවති අතර, එයින් කඩ 188 කින් ලැබියයුතු ආදායම් මාස 03 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ඈ) මධ්‍යම වෙළඳ පොළේ කඩ කාමර 28 ක් අතුරු බදු දී තිබුණි.

2.3.5 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ හා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව, දුරකථන විදුලි සංදේශ කුළුණු සඳහා උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් ද, ඊට වැඩිවන

සෑම මීටර් එකකටම රු.100 බැගින් ද ගාස්තු අය කළයුතු වුවත්, සභා බල ප්‍රදේශයේ අනවසරයෙන් ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 59 ක් වෙනුවෙන් සභාවට දළ වශයෙන් රු.1,180,000 කට වැඩි ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) යථෝක්ත ගැසට් නිවේදනයේ v උපලේඛනය අංක 06 හි සඳහන් කර ඇති පරිදි උස සෑම මීටර් 05 කට ම රු.10,000 ත් බැගින් වූ ගාස්තු අය කළයුතු බව අවධාරණය කර තිබුණ ද, බල ප්‍රදේශය තුළ ඉදි කර තිබූ අනවසර සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධව ක්ෂේත්‍ර නිලධාරින් විසින් සභාවට වාර්තා කර, ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ඇ) සම්ප්‍රේෂණ කුළුණු 63 ක් මගින් සන්නිවේදන පහසුකම් සපයා තිබූ සමාගම් අනුව, වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අය කර ගතයුතු වුව ද, වසර 10 කට වැඩි කාල සීමාවක සිට බලපත්‍ර ගාස්තු ලෙස කිසිදු මුදලක් අය කර නොතිබුණි. මේ හේතුවෙන්, දළ වශයෙන් රු.500,000 කට අධික මුදලක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) 2010 නොවැම්බර් 26 දිනැති අංක 1682, 2011 නොවැම්බර් 04 දිනැති අංක 1731 හා 2012 නොවැම්බර් 16 දිනැති අංක 1785 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදන අනුව, 2011, 2012 හා 2013 වර්ෂයන් හී දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා වර්ෂයකට රු.5,000 ක ව්‍යාපාර බදු නියම කර තිබුණ ද, එම නියමය පරිදි ගාස්තු අය කර නොතිබුණි. මේ හේතුවෙන්, පසු ගිය වර්ෂ 03 ට අදාළව පමණක් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා ඉඩකඩ සපයා දීමට අදාළ ගාස්තු අය නොකිරීම හේතුවෙන්, රු.960,000 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

2.3.6 <u>බෝගම්බර සති පොළ අයිතිය බදු දීම.</u>

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) බෝගම්බර සති පොළ ගාස්තු අය කිරීමේ අයිතිය බදු දීමේ ගිවිසුමේ 02 වන කොන්දේසිය ප්‍රකාරව ගිවිසුම්ගත දින සිට මාස 03 ක් ඇතුළත මුළු බදු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කළයුතු වුව ද, ඊට පටහැනිව දින 40 ක් ප්‍රමාද කර ගෙවා තිබුණි. එසේ වුව ද, ගිවිසුම ප්‍රකාර එම පමාව සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) බදුකරුගෙන් අය කරනු ලබන දෛනික කසළ ගාස්තු 2009 වර්ෂයේ සිට නොවෙනස්ව පැවතුණද, කසළ එකතු කිරීමේ හා බැහැරලීමේ පිරිවැය ඉහළ යාමට සමානුපාතිකව මෙම ගාස්තු සංශෝධනය සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබීමෙන්, සභාවට ලබා ගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.

(ඇ) සභා සීමාවට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දි ව්‍යාපාර බදු නොගෙවා, පවත්වා තිබූ ව්‍යාපාර ආයතන 58 ක් පැවති බව අනාවරණය වූ අතර, මේ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.290,000 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

2.3.7 <u>පරිසර බලපත්‍ර ගාස්තු.</u>

2012 වර්ෂයට අදාළව පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබූ ව්‍යාපාර වලින් සභාවට රු.1,428,200 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

2.3.8 දැන්වීම් පුවරු.

2012 නොවැම්බර් 16 දිනැති අංක 1785 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයට අනුව, දැන්වීම් පුවරු ගාස්තු අය කර නොගැනීම හේතුවෙන්, රු.2,878,963 ක් පමණ සභාවට අහිමි වී තිබුණි.

2.4 අවිධිමත් ගනුදෙනු

කැළි කසළ ප්‍රවාහනය සඳහා වාහන මිලට ගැනීම.

රියෝ ග්‍රැෆික් ආයතනය මගින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ චීනයේ නිෂ්පාදිත නවතම වාහන වර්ගයක් වූ කම්පැක්ටර් දේශීය වෙළඳ පොළට අලුතින්ම ගෙන්වනු ලබන වාහන වර්ගයක් වන බැවින්, මෙම රථ සඳහා දේශීය වෙළඳ පොළ තුළ අමතර කොටස් හා නඩත්තුව සම්බන්ධව ගැටළු ඇති විය හැකි බව තාක්ෂණික ඇගයීම් කමිටුව පෙන්වා දී තිබුණි. එය නොසළකා එම වර්ගයට අයත් වාහන 04 ක් සමාලෝචිත වර්ෂයේදී මිල දී ගැනීම සඳහා රු.26,864,588 ක මුදලක් වැය කර තිබුණි. සේවයේ යොදවන ලද මුල් අවස්ථාවේ සිටම එම රථ බරපතල ලෙස කාර්මික දෝෂයන්ට ලක්ව තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ක්ලච් ප්ලේටරය, හයිඩ්‍රොලික් ජැක්, ක්ලච් පොම්පය, ජැක් ඔයිල් සීල්, ඔයිල් ෆිල්ටර්, ඩීසල් ෆිල්ටර් සැපයුම්කරු විසින් ප්‍රතිෂ්ඨාපනය කර තිබූ අතර, සභාව විසින් මුල් මාස 10 තුළ එම අලුත්වැඩියා කටයුතු සඳහා රු.360,369 ක මුදලක් වැය කර තිබුණි.

පරීක්ෂණ දිනය වූ 2013 පෙබරවාරි 21 දින වන විට ඉන් වාහන 02 ක් අලුත්වැඩියා කටයුතු සඳහා ධාවනයෙන් ඉවත් කර තිබූ අතර, එක් වාහනයක් අලුත්වැඩියාවට අවශ්‍ය උපාංග දේශීය වෙළඳ පොළේ නොමැතිවීම හේතුවෙන්, අමතර කොටස් ආනයනය කර, අලුත්වැඩියා කර තිබූ අතර, එක් ගමන් වාරයකින් පසු නැවත අලුත්වැඩියාව සඳහා යොමු කර තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවකයින්ට ලබා දී තිබූ දේපළ ණය පොළී සඳහා රජයේ දායක මුදල් වශයෙන් 2011 සහ 2012 වර්ෂ සඳහා සභා අරමුදලින් රු.3,429,252 ක් ගෙවා තිබූ අතර, මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ආ) මීට වසර 10 කට පෙර සිදුව තිබූ රිය අනතුරක් හේතුවෙන්, සභාවට වූ රු.380,460 ක අලාභය, අය කර ගැනීම පිණිස නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව එමගින් සිදුව තිබුණු අලාභය හිඟහිටි ආදායම් වශයෙන් දිගින් දිගටම ගිණුම්වල පෙන්නුම් කර තිබුණි.

(ඈ) සභාවේ විදුලි පද්ධතිය 1995 වර්ෂයේ දී ලංකා විදුලි බල මණ්ඩලයට පැවරීමේ දී සභාවට අයවියයුතු වූ රු.43,599,525 ක් හා පවරා දෙන අවස්ථාවේ දී පැවති විදුලිය ණය ගැතියෝ රු.50,443,104 ක් නිරවුල් නොකර, දිගින් දිගටම සභාවේ වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) 2013 අප්‍රේල් 20 දින විශ්‍රාම ගිය පවුල් සෞඛ්‍යසේවා නිලධාරිනියකගෙන් 2008 ජනවාරි 18 දින සිට 2008 අගෝස්තු 06 දින දක්වා කාල සීමාවට අදාළව සභාවට අය වියයුතුව තිබූ හිග ජල ගාස්තුව රු.34,567 ක මුදලක් එම නිලධාරිනියගේ වැටුපෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර ගෙන නොතිබුණි.

2.6 <u>ඝන අපද්‍රව්‍ය කළමණාකරණය</u>

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය එක් රැස් කිරීම හා අළෙවි කිරිම සඳහා නගරය තුළ ආරම්භ කරන ලද සම්පත් මධ්‍යස්ථානය 2012 දෙසැම්බර් 31 දින වන විට රු.5,932,695 ක අළෙවි ආදායමක් ලබා තිබූ අතර, එම ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා රු.5,483,220 ක් වැය කර තිබුණි. එමගින් උපයන ලද ආදායම් හා වියදම් සභාවේ ආදායම් හා වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. කසළ එක් රැස් කරන මධ්‍යස්ථානවල මුදල් පරිහරණය කටයුතු අනියම් සේවකයින් තුන් දෙනකු යොදවා ගෙන කරනු ලබන අතර, සමාලෝචිත වර්ෂය තුළ ඊට අදාළව සභාව වෙත භාර දෙන ලද රු.460,000 ක මුදලක් තැන්පත් ගිණුම යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන්, රාජ්‍ය මුදල් සම්බන්ධව නිසි ආරක්ෂක ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පරිපාලනය